"දේව බලෙන් යළි ගයන වික්ටර්..." යන සිරස්තලයෙන් යුතුව දිවයින ඉරිදා සංග්‍රහයේ (01/31) වික්ටර් රත්නායක සම්බන්ධයෙන් ලිපියක් පළවී තිබිණි. එහි වික්ටර් රත්නායකගේ පෞද්ගලික ජීවිතය සහ ඔහුගේ ජීවිතය සම්බන්ධ පෞද්ගලික තීරණයන් සම්බන්ධයෙන් වන අපහාසාත්මක කරුණු හා මත දැක්වීම්ද, ඔහුගේ වත්මන් බිරිඳ සම්බන්ධයෙන් අපහාසාත්මක හා ගර්හාත්මක දැක්වීම්ද ඇතුළත්ව තිබුණු බව නිරීක්ෂණය කළ හැකි විණි. ඊට අමතරව මෙම ලිපිය තුළ එම තැනැත්තිය සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කෙරෙනා ඒකාකෘතික කිරීම් හා කොන් කිරීමේ අදහස්ද ඇතුළත් විණි. කෙසේ නමුත් මෙම ලිපියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් වික්ටර්ගෙන් සහ බිරිඳගේ පාර්ශවයෙන් කිසිදු විමසීමක්ද කර නොතිබුණි.

එසේම එම ලිපියේ දිගුවක් ලෙසින් වික්ටර් රත්නායකගේ මිතුරෙකු වන දයා විජේසේකර සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවක්ද පළවී තිබිණි. කෙසේ නමුත් ප්‍රස්තුත ලිපියේ හෝ සම්මුඛ සාකච්ඡාවේ වික්ටර් රත්නායක සම්බන්ධයෙන් සිදුකර ඇති ප්‍රකාශ පිළිබඳව කරුණු විමසීමක් අදාළ මාධ්‍යවේදියා විසින් වික්ටර් රත්නායක පාර්ශවයෙන් ලබාගැනීමට උත්සාහ කොට තිබේද? එසේ කර ඇතිනම් ඒ බව සඳහන් කළ යුතු නොවේද?

එසේම යම් කිසිවෙකුගේ පෞද්ගලික ජීවිතයේ ගන්නා තීරණ හෝ පෞද්ගලික ජීවිතය ගත කරන ආකාරය සම්බන්ධයෙන් මෙවැනි පෞද්ගලික ප්‍රහාර සහ ගර්හාත්මක කරුණු දැක්වීම් ඉදිරිපත් කිරීම කෙතරම් දුරට මාධ්‍ය සදාචාරයට අනුකූල වන්නේද? එම කරුණු සමග දෝෂාරෝපණයට ලක් කොට ඇති පාර්ශවයන්ගෙන් කිසිදු කරුණු විමසුමක් හෝ සිදුකර නොතිබීම ඔස්සේ මෙය ඒකපාර්ශ්වික කරුණු දැක්වීමක් නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina